# කලාවේ පණිවුඩය

බටහිර කෙටිකතාව අනෙක් සාහිත්‍යාංගවලින් හා කලා කෘතිවලින් පමණක් නො ව බටහිර විද්‍යාවෙන් ද වෙන් වන්නේ මතුපිටින් ය. අභ්‍යන්තරයෙන් ඒ සියල්ල ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙන් බැඳී ඇත. බටහිර සාහිත්‍යය ආගමෙන් නිදහස් වීමක් ගැන කතා කරන ඊනියා සාහිත්‍ය විචාරකයන් නො දන්නා කරුණක් නම් බටහිර විද්‍යාව වුව ද ආගමෙන් නිදහස් වී නොමැති බව ය. අප බොහෝ අවස්ථාවල පෙන්වා දී ඇති පරිදි ඩාවිනීය පරිණාමවාදය මෙන් ම විශ්වවේදයේ සඳහන් වන මහා පිපිරුම ද පිටුපස ඒකරේඛීය චින්තනය හා මැවීම (ඉබේ ම හෝ) ඇත.

බටහිර සාහිත්‍යයෙන් හා කලාවෙන් පණිවුඩ නො දිය යුතු බවක් කියැවෙයි. ඉන් කියැවෙන්නේ සමාජය යහමඟ යැවීමක් ගැන බටහිර කෙටිකතාව ඔස්සේ හෝ වෙනත් කලා මාධ්‍යයක් ඔස්සේ නො කිව යුතු බව ය. ඒ අතර බටහිර සාහිත්‍යය විසින් අවිඥානික ව කෙරෙන දෙයක් නම් බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට අනුරූප ව පුද්ගලයන් එකිනෙකාගෙන් වෙන් කිරම ය. එපමණක් නො ව, ඒ පුද්ගලයන් තම තමන්ගේ අනාගතය තම තමන් නිර්මාණය කළ යුතු ය යන අදහස ද දෙනු ලැබෙයි.

මෙය වත්මන් සමාජයේ ඊනියා යථාර්ථය නිරූපණය වීමක් යැ යි කෙනකුට කීමට ඉඩ ඇත. එහෙත් මෙහ දී ප්‍රශ්න රාශියක් පැනනඟියි. ඉන් එකක්, දෙකක් පමණක් ගෙනහැර දැක්වීමට අදහස් කරමි. පළමුවෙන් ම යථාර්ථය පිළිබඳ ප්‍රශ්නය වෙයි. බටහිර නිව්ටෝනීය සුසමාදර්ශය අනුව නිරකෂකයාගෙන් ස්වායත්ත වූ යථාර්ථයක් වෙයි. මේ ඊනියා යථාර්ථය දැනගැනීම බටහිර විද්‍යාඥයාගේ මෙන් ම බටහිර කලාකරුවාගේ ද අභිප්‍රාය වෙයි. (ලංකාවේ සිටින බටහිරයන් අනුකරණය කරන කලාකරුවෝ ද, තුන්වැනි පන්තියේ වුවත් බටහිර කලාකරුවෝ ම වෙති) යථාර්ථයක් ඇතැ යි උපකල්පනය කරමින් ඒ දැනැගනීමට උත්සාහ කිරම ප්‍රශ්නයක් වෙයි.

ඊනියා යථාර්ථය දැනගැනීමෙහි ලා ඇති ගැටලුවක් වනුයේ මේ ඊනියා යථාර්ථය දැනගැනීමට ක්‍රමයක් නැති වීම ය. ඒ බව දැන් දැන් බටහිරයන්ට ම තේරෙන්නට පටන්ගෙන ඇත. මේ ඊනියා යථාර්ථය ම ද නිර්මාණයක් බව ඔවුනට දැන් ක්‍රමයෙන් වැටහෙමින් පවතියි. ඔවුන් දැන් ඊනියා යථයක් (Real)- ගැන නන්දොඩවීමට පටන්ගෙන ඇත්තේ එබැවින් ය. ඊනියා යථාර්ථය දැනැගනීමට කරන උත්සාහයේ දී බටහිර විද්‍යාඥයා අතින් මෙන් ම බටහිර කලාකරුවා අතින් ද සිදුවන්නේ නිර්මාණයක් ඉදිරිපත් කිරම පමණ ය. එහෙත් දැනට කාලයක් තිස්සේ බටහිරයන් ඊනියා යථාර්තය නමින් ඉදිරිපත්කර ඇත්තේ මේ එක් එක් අයගේ නිර්මාණ පමණ ය. යථාර්ථයක් නැති කල වෙනත් දෙයක් කළ හැකි ද නො වෙයි.

කලා කෘතියකින් ඊනියා යථාර්ථය ඉදිරිපත් කරනු හැරෙන්නට සමාජයට පණිවුඩයක් නො දෙන්නේ ය යන්නෙහි පිටුපස අත්තේ කලාකරුවාට තමන් ඉදිරිපත් කරන ඊනියා යථාර්ථය වෙනස් කිරමට නොහැකි බව ය. පණිවුඩයක් දීමෙහි ප්‍රධාන අරමුණ ඒ ඔස්සේ පුද්ගලයා හා සමාජය වෙනස් කිරම ය. එහෙත් ඊනියා යථාර්ථය වෙනස් කළ හැක්කේ නො වෙයි. නිව්ටෝනීය ගුරුත්වාකර්ෂණය යථාර්ථයක් නම් ඒ වෙනස් කරන්නේ කෙසේ ද? තවදුරටත් බටහිරයන්ට අනුව නිව්ටන් විද්වතා විසින් කෙර ඇත්තේ යථාර්ථය වූ ගුරුත්වාකර්ෂණය සොයා ගැනීම පමණකි. ඔහුට හෝ වෙනත් කවරකුට හෝ ඒ ඊනියා යථාර්ථය වෙනස් නො කළ හැකි ය. ඊනියා යථාර්ථය යනු අන්කිසිවක් නො ව දෙවියන්වහන්සේ ලෝකය මවා ඇති ආකාරය ය. ඊනියා යථාර්ථය යනු දෙවියන්වහන්සේගේ මැවීම (හෝ දෙවියන්වහන්සේ නැති ව හෝ මහා පිපිරුමෙහි මෙන් ඉබේ කෙරෙන මැවීම) නම් බටහිර විද්‍යාඥයන් හා බටහිර කලාකරුවන් උත්සාහ කරන්නේ ඒ දෙවියන්වහන්සේ මැවීම තේරුම් ගැනීමට ය.

සමාජයට පණිවුඩයක් නො දෙන්නේ සමාජය වෙනස් කිරමට නොහැකි බවට බටහිරයන් ඇති කරගෙන ඇති මතය නිසා ය. සමාජය වෙනස් නො වන බවක් මෙයින් ගම්‍ය නො වෙයි. එහෙත් සමාජය වෙනස් වන්නේ ඊනියා යථාර්ථයක් වූ නීති රීති (නියම) පද්ධතියක් අනුව ය. මාක්ස්වාදයෙහි ද මාක්ස්වාදීහු එවැනි යථාර්ථයක් ගැන කතා කරති. මාක්ස්වාදීන් සමාජය වෙනස් කිරමට උත්සාහ ගන්නේ සමාජය එසේ වෙනස් වන බැවිනි. මාක්ස්වාදයට අනුව ඊනියා කම්කරු පංතිය ධනේෂ්වරය පෙරළා බලයට පත් වෙයි. ඒ කවදා හෝ සිදු වෙයි. එහෙත් මාක්ස්වාදීන්ට අනුව තිබෙන

© Prof. Nalin De Silva

ප්‍රශ්නය වෙනත් අයකු කම්කරු පංතියට ඒ බව කීමට, ඉගැන්වීමට අවශ්‍ය වීම ය. (වැඩි විස්තර සඳහා මාක්ස්වාදයේ දරිද්‍රතාව හා අපෝහකයේ රූපිකය කියවන්න) මේ ඉගැන්වීම කර කම්කරු පංතිය තමන් කළ යුතු කාර්යය කිරම සඳහා සංවිධානය කිරමට මාක්ස්වාදීහු උත්සාහ කරති. සමාජය වෙනස් වන බැවින් මාක්ස්වාදීහු ඒ වෙනස කිරමට උත්සාහ කරති.

මිනිසාගේ ස්වාධීන ව පවත්නා නීති රති (නියම) අනුව ග්‍රහවස්තුවල චලනයෙහි සිට සමාජයෙහි වෙනස් වීම දක්වා කෙරෙන්නේ නම් මිනිසා කළ යුතු ව ඇති කාර්යයක් නැත. තවදුරටත් මිනිසාගේ මනසෙහි ක්‍රියාකාරත්වය ද සිදුවන්නේ යම් භෞතික වූ නීති රති පද්ධතියකට අනුව නම් මිනිසා තම ක්‍රියා පිළිබඳ ව වගකිවයුතු නැත. මනස යනු අවසාන වශයෙන් මොළයේ ක්‍රියාකාරත්වය නම් මිනිසා වගකිව යුතු ව ඇත්තේ කුමක් සඳහා ද?

අද ඇතැම් අනුකාරකයෝ ලකාන් පඬිවරයා වැන්නන් අනුකරණය කරමින් රාගය ආදිය ශරරයේ ඇතැම් ක්‍රියාකාරකම් නිසා ඇතිවන්නේ යැයි පෙන්වීමට උත්සාහ ගනිති. ඒ එසේ නම් මනමේ කුමරිය වැදි රජුට සිත් බැඳ ගත්තේ මනස නිසා නො ව ශරරයේ ඇති වූ යම් ක්‍රියාකාරකමක් හේතු කොටගෙන ය. එසේ නම් මනමේ කුමරිය මනමේ කුමරු අත්හැර වැදි රජු කරා යෑමේ වරදක් කර නැත. මනමේ කුමරිය තමා සිතාමතා එවැන්නක් කළා නො ව ශරරයේ ක්‍රියාකාරකම් නිසා එසේ සිදු විය. සියල්ල භෞතිකයට ඌනනය කරන බටහිරයන්ට මනමේ කුමරියට දිය යුතු ඔවදනක් නැත. ඔවදන් දුන්න ද ඇයට කළ හැකි කිසිවක් නැත. පොළොව සුර්යයාට ආකර්ෂණය වන්නාක් මෙන්, එහෙත් ගුරුත්වය නො වන වෙනත් භෞතික හේතු නිසා මනමේ කුමරිය වැදිරජුට ආකර්ෂණය වෙයි.

මනමේ කුමරිය පමණක් නො ව අප කිසිවකු අපේ කිසි ම ක්‍රියාවකට වගකිවයුතු නැත. මේ ඊනියා මනෝ විශ්ලේෂණයට අනුව අපේ මනස යනුවෙන් අප හඳුනා ගන්නා දෙය ශරරයේ භෞතික ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයකි. එසේ නම් සමාජයට පණිවුඩ දෙන්නේ කුමකට ද? පණිවුඩයක් අවසානයේ දී සංනිවේදනය වන්නේ පුද්ගලයාට ය. පුද්ගලයාට ඇත්තේ ශරරයේ භෞතික ක්‍රියාකාරකම් මත පදනම් වූ මනසක් නම් පණිවුඩවලින් වැඩක් නැත. මේ බටහිරයන් සිතන ආකාරයයි. ඔවුන්ගේ නීති රති අනුව බටහිරයන් එසේ සිතනවා යනුවෙන් කීම ද වැරදි ය. බටහිරයන්ට එසේ සිතීමට ශරරයේ භෞතික ක්‍රියාකාරකම් විසින් යොමු කෙර ඇත.

මේ ප්‍රවාද අනුව සුචරිතයක් හෝ දුශ්චරිතයක් හෝ නැත. වැඩි ම වුව හොත් ඇත්තේ ශරරයේ විවිධ භෞතික සැකැස්ම පමණකි. එහෙත් බටහිරයන් අනුකරණය කරන මෙරට පුස්සෝ තමන් කියන දෙය අමතක කර වෙනත් ආකාරයකින් කියන්නේ නම් අසංගත ව, විවිධ පුද්ගලයන්ට ඔවුන් කළා යැයි කියන ක්‍රියා පිළිබඳ වගකීම පවරති. පුද්ගලයන් ක්‍රියා කරන්නේ රොබෝ මෙන් ශරරයේ භෞතික ක්‍රියාකාරකම් නිසා නම් පුද්ගලයකු කෙළේ යැයි කියන යම් ක්‍රියාවක් පිළිබඳ ඒ පුද්ගලයාට දොස් පැවරිය නොහැකි ය. රොබෝවක ක්‍රියාකාරත්වය පිළිබඳව අපි රොබෝවට වගකීම නො පවරමු. එහෙත් අනුකාරකයෝ අසංගත වෙති. ශරරයේ ක්‍රියාකාරකම් මත මනස පිළිබඳ ආකෘති ගොඩනගන අතර ම ඔවුහු ඒ ඒ පුද්ගලයන්ට චෝදනා කරති.

බටහිර විද්‍යාඥයන්ගේ ඌනිතවාදී දර්ශනය බටහිරයන්ගේ කලාවට ගොස් ඇත්තේ ඉහත සඳහන් ආකාරයට කලාවෙහි පණිවුඩ අනවශ්‍ය වේ ය යන ආකාරයෙන් ය. එහි තවත් පැත්තක් ද වෙයි. එය ද අප කලින් සඳහන් කර ඇත. කලාව අනෙක් කෙෂ්ත්‍රවලින් වෙන් කෙරුණු පසු කලාව ඒ වෙනත් කෙෂ්ත්‍රවල කාර්යයන්ගෙන් නිදහස් විය යුතු ය. පණිවුඩ දීම හෝ සමාජය යහමග යැවීම හෝ ආගමෙහි කාර්යයක් නම් කලාව එයට අතගැසිය යුතු නො වෙයි. කලාව ඒ ඒ කෙෂ්ත්‍රයට අදාළ ආකාරයට වචන, රූපරාමු, දෙබස්, රඟපෑම්, නාදරටා ආදිය හසුරවමින් අනෙක් කෙෂ්ත්‍රවලින් වෙන් වී ඊනියා යථාර්ථය නිරූපණය කිරමට කටයුතු කරයි.

කලාව පිළිබඳ එවැනි හැඳින්වීමක් බටහිර ලෝකයෙහි සෑම කාලයක ම තිබිණි යැ යි ඉන් ගම්‍ය නො වෙයි. එහෙත් පසුගිය අවුරුදු සියයක පමණ කාලයක බටහිර කලාව විකාශනය වී ඇත්තේ එවැනි දිශාවකට ය. මාර්ටින් වික්‍රමසිංහ මහතා ජීවත් ව සිටි කාලයෙහි ද ඒ අදහස් අඩු වැඩි වශයෙන් පැවතිණි. වික්‍රමසිංහ මහතා තම කෙටි කතාවලින් හෝ නවකතාවලින් හෝ පණිවුඩ දීමට තැත් නො කෙළේ ය. බටහිර කෙටිකතාවෙහි එකල ද එවැනි පණිවුඩ දීමක් නො

© Prof. Nalin De Silva

සිදුවූ බව ඒ මහතා දැන සිටියේ ය. ඒ මහතාට වුවමනා වූයේ තම කෙටිකතාවෙන් ඊනියා යථාර්ථය නිරූපණය කිරමට ය.

එහෙත් ජාතක කතාව එසේ නො වී ය. ජාතක කතාවෙන් සමාජය යහ මඟ යැවීමට උත්සාහයක් ගැනිණි. යහ මඟ යනු සාපේක්ෂ දෙයක් බවත්, ජාතක කතාවෙහි යහ මඟ සිංහල බෞද්ධ සංස්කෘතියට අනුව අර්ථ දැක්වුණු බවත් ව්‍යාජ පඬිවරුන්ගේ දැනගැනීම සඳහා සටහන් කළ යුතු වෙයි. සාපේක්ෂ අර්ථයකින් වුවත් මනසක් ඇතැ යි කියන අපට සමාජය යහමඟ යැවීම වැදගත් වෙයි. අතීතයේ හුදු කලාවක් නො තිබූ අවධියක දී සිංහල බෞද්ධයන් යහ මඟ යැවීමේ කාර්යය ජාතක කතාවෙන් ද සිදුවිය. එහෙත් අද සිදුවන්නේ, එසේත් නැත්නම් මාර්ටින් වික්‍රමසිංහ මහතා කෙටිකතා ලිවීම ඇරඹූ අවධියෙහි සිට සිදුවෙමින් පවතින්නේ, කුමක් ද?

අද බොහෝ දෙනා ටෙලිනාට්‍ය නරඹති. මේ ටෙලිනාට්‍යවලින් නිරූපණය වන්නේ මෙරට සමාජය ය. ඒ නිරූපණයෙහි නොයෙකුත් අඩුපාඩුකම් තිබිය හැකි ය. එහෙත් සමස්තයක් ලෙස ගත් කල ඉන් සමාජයෙහි විවිධ තරාතිරම්වල පුද්ගලයන් මෙන් ම ඔවුන්ගේ ක්‍රියාකාරකම් ද දැකිය හැකි ය. ඒ අතර ඇතැමුන් සමාජයට විවිධ දේ කැවීමට, නැත්නම් පුරුදු කිරමට ගන්නා උත්සාහයන් ද අපට දැකගත හැකි ය. ඒ බොහෝ විට බටහිර සමාජය අනුකිරීම සඳහා ප්‍රේක්ෂකයන් පෙලඹවීමට දරන උත්සාහයන් වෙයි. ඉඳහිට පොහොය දිනක ප්‍රචාරය වන වැඩසටහනක හැරෙන්නට සමාජය යහමඟ යැවීමට ගන්නා උත්සාහයක් ටෙලිනාට්‍යවල නැතියි කිව හැකි ය. ටෙලිනාට්‍යයෙන් හෝ වෙනත් කලා කෘතියකින් හෝ වුවමනාවෙන් පණිවුඩයක් නො දුන්න ද ඇතැම් කරුණු අවිඥානික ව සංනිවේදනය වන බව අමතක නො කළ යුතු ය. එසේ නම් සමස්තයක් ලෙස ගත් කල අද ටෙලිනාට්‍ය ඔස්සේ ද යම් යම් පණිවුඩ සමාජයට කාන්දු වෙයි. මේ පණිවුඩවලින් සමාජයට අවසානයේ දී සිදු විය හැක්කේ කුමක් ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva